# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

### 05 වන පාඩම ; නිර්වාණය

**[[ 2024/2025 ]]** 04 වන ප්‍රශ්නය

I නිවන නොපිළිගත් බුද්ධකාලීන ඉන්දියානු සමාජයේ පැවති දෘෂ්ටිවාද දෙකක් නම් කරන්න.
II නිවන හැඳින්වීම සඳහා පාලි සාහිත්‍යයේ භාවිතා වන පාලි රූප හතරක් එහි තේරුම් සමඟ ගෙනහැර දක්වන්න.
III අ) සෝවාන් ඵලයට පත්වන විට ප්‍රහීනවන සංයෝජන තුන නම් කරන්න.
ආ) ඉහත 4හි [3]අ) අදාළ සංයෝජන තුන කෙටියෙන් හඳුන්වන්න.
IV නිවන පිළිබඳ ලෞකික හා ලෝකෝත්තර පැහැදිලි කිරීම් බෞද්ධ සාහිත්‍යයේ හමුවන නිදර්ශන ඇසුරෙන් පරීක්ෂා කරන්න.

**[[ 2019/2020 ]]** 05 වන ප්‍රශ්නය

I –
II නිවන් මග ආවරණය කරන ධර්ම පහ නම් කරන්න.

**[[ 2017/2018 ]]** 04 වන ප්‍රශ්නය

I නිබ්බාණ (නිවන) යන පදයෙන් ඉදිරිපත් කෙරෙන අර්ථ තුනක් දක්වන්න.
II ආර්ය සත්‍ය විෂයෙහිදී නිවන හඳුන්වන නම් ලියා එම සත්‍ය කෙටියෙන් හඳුන්වන්න.
III නිවනෙහි පළමු පියවර නම් කර, එමඟින් සිඳී යන සංයෝජන ධර්ම පෙන්වාදී ඒවායින් දෙකක් හඳුන්වන්න.
IV ලෝකෝත්තර වශයෙන් නිවුණු පුද්ගලයා හඳුන්වා, ඔහුගේ ස්වභාවය නිදසුනක් මඟින් පෙන්වාදී,නිවනට අයත් ප්‍රභේද දෙකෙහි නම් ලියන්න.

**[[ 2016/2017 ]]** 01 වන ප්‍රශ්නය

I ආර්ය සත්‍ය විෂයෙහිදී නිවන හඳුන්වන නම ලියන්න.
II නිවන අසංඛත ධර්මයක් වන්නේ කවර හේතුවක් නිසාදැයි දක්වන්න.
III නිර්වාණාවබෝධය ලබන පුද්ගලයින් හඳුන්වන නම් ලියා, සෝවාන් මාර්ග ඥාණයෙන් ප්‍රහීනය වන සංයෝජන ධර්ම නම් කරන්න.
IV පරිනිර්වාණ අවශ්ථා දෙක නම් කර, ඒ දෙකෙහි වෙනස කවරේදැයි පැහැදිලි කරන්න.

## [[ 2012/2013 ]] 04 වන ප්‍රශ්නය

I බෞද්ධ විමුක්ති මාර්ගය(නිවන) හැඳින්වීමට යොදා ඇති වෙනත් වචන දක්වන්න.
II නිර්වාණගාමී මාර්ගය පියවර හතරකින් යුක්තය.එම පියවර හතර නම් කරන්න.
III එම පියවරයන්ට අනුකූලව දස සංයෝජන ධර්ම දුරු කරන ආකාරය පෙන්වා දෙන්න.
IV නිවන අවබෝධ කළ උතුමා කුසල් හෝ අකුසල් නොකරයි.එහෙත් කුසල අකුසල කර්මයන්හි විපාක විඳී. රහතන් වහන්සේලා දෙනමක් ඇසුරු කර ගනිමින් මෙය පහදන්න.

## [[ 2010/2011 ]] 04 වන ප්‍රශ්නය

I "පරිනිර්වාණය කොටස් දෙකකින් දක්වා ඇත." එම කොටස් දෙක දක්වන්න.
II එම කොටස් වෙන් වෙන් වශයෙන් හඳුන්වන්න.
III නිවන් මග පියවර හතරකින් යුක්තය.එම පියවර හතර ලියා කාමරාග හා ව්‍යාපාද යන සංයෝජන ධර්ම තුනී වන පියවර කවරේදැයි දක්වන්න.
IV "සසර දුක නම් පරම සුඛය නිවනයි."මෙම ප්‍රකාශයට අදාළව සසරෙහි හා නිවනෙහි ස්වභාවය කෙටියෙන් හඳුන්වන්න.

## [[ 2009/2010 ]] 01 වන ප්‍රශ්නය

I බුදු සමයෙහි පරම නිෂ්ඨාව ලෙස හඳුන්වන සත්‍ය නම් කරන්න.
II එම සත්‍ය එසේ සැළකීමට හේතු වූ සාධක දෙකක් දක්වන්න.
III නිර්වාණයෙහි ස්වභාවය කෙටියෙන් හඳුන්වා ,එය වුපසමය මුල්කොටගත් සුවයක් ලෙස සැළකෙන්නේ කවර කරුණක් නිසාදැයි පෙන්නුම් කරන්න.
IV නිවනෙහි ආකාරය හෙවත් ලක්ෂණ හැඳින ගැනීමේදී දක්වා ඇති ප්‍රභේද නම් කර කෙටියෙන් හඳුන්වන්න.

## [[ 2008/2009 ]] 02 වන ප්‍රශ්නය

I නිවන (නිබ්බාණ) යන්නෙන් ප්‍රකාශ වන එක් අර්ථයක් දක්වා' එය අයත් වන සත්‍යය නම් කරන්න.
II නිවනෙහි පළමු පියවර කවරේදැයි ලියා' එමඟින් නැසෙන සංයෝජන ධර්ම දක්වන්න.

III එම සංයෝජන ධර්ම කෙටියෙන් හඳුන්වන්න.

IV "සසර දුක නම් නිවන පරම සුවයයි."නිවන පරම සුවයක් ලෙස දේශනා කිරීමට හේතු සාධක ඉදිරිපත් කරන්න.

## [[ 2006/2007 ]] 02 වන ප්‍රශ්නය

I සතර මාර්ග ඥාණ නම් කරන්න.

II එම මාර්ග ඥාණයන්ගෙන් ප්‍රහීන වන සංයෝජන ධර්ම වෙන් වෙන් වශයෙන් දක්වන්න.

III දෙවැදෑරුම් පරිනිර්වාණ අවශ්ථා දක්වා, ඒවායේ වෙනස පහදන්න.

IV නිර්වාණය අවබෝධ කළ රහතන් වහන්සේ ගැන හැඳින්වීමක් කරන්න

## [[[[[ 2005 ]]]]] 04 වන ප්‍රශ්නය

I "නිබ්බානං" මෙම පදයෙන් ඉදිරිපත් කරන අර්ථ දෙකක් ගෙනහැර දක්වන්න.

II ආර්ය සත්‍ය විෂයෙහිදී මෙය හඳුන්වන නම ලියා, එම සත්‍යය කෙටියෙන් හඳුන්වන්න.

III ව්‍යවහාරික ලෝකයේදී පුද්ගලයා යනුවෙන් හඳුන්වන්නේ කවරක්දැයි ලියා නිවනට පත් ත්‍රිවිධ පුද්ගලයින් නම් කරන්න.

IV ලෝකෝත්තර වශයෙන් නිවුණු (නිබ්බාන) පුද්ගලයා යනු කවරෙක්දැයි දක්වා, ඔහුගේ ස්වභාවය නිදසුනක් මඟින් පෙන්වා දෙන්න.

## [[[[[ 2003 ]]]]] 04 වන ප්‍රශ්නය

I පංචස්කන්ධය මූලික වශයෙන් බෙදෙන ධර්ම කොටස් දෙක නම් කරන්න.

II මග-ඵල වශයෙන් නිවනෙහි පියවර කොටස් කර දක්වන්න.

III නිවනෙහි තුන් වැදෑරුම් ලක්ෂණ නම් වශයෙන් ලියා, ඒවායින් එකක් හඳුන්වන්න.

IV නිවන පරම සැපයක් කොට සැළකීමට හේතු සාධක ඉදිරිපත් කරන්න.

## [[[[[ 2002 ]]]]] 02 වන ප්‍රශ්නය

I ත්‍රිවිද්‍යාව නම් කරන්න.

II ඒවායින් එකක් විස්තර කරන්න.

III සෝපාදිසේස-නිරුපාදිසේස(අනුපාදිසේස) පිරිනිවන් පැහැදිලි කරන්න.

IV ඕරම්භාගිය සංයෝජන හා උද්ධම්භාගිය සංයෝජන නම් කර අරුත් දක්වන්න.

## [[[[[ 2001 ]]]]] 03 වන ප්‍රශ්නය

I –

II –

III නිර්වාණය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

## [[[[[ 1998 ]]]]] 04 වන ප්‍රශ්නය

I නිර්වාණ මාර්ගයේ දැක්වෙන ඵල අවශ්ථා හතර නම් කරන්න.

II සෝතාපත්ති ඵලයට පත්වීමෙන් සිදී යන සංයෝජන තුනෙන් දෙකක් නම් කරන්න.

III නිර්වාණයේ ප්‍රභේද දෙක නම් කර ඒවායේ වෙනස සැකෙවින් පැහැදිලි කරන්න.

IV බෞද්ධ ඉගැන්වීම් අනුව නිර්වාණය සාක්ෂාත් කිරීම යනු මරණීන් මතු වඩා සැපවත් ගතියකට පත්වීම නොවේ.යන්න සනාථ කොට දක්වන්න.